## කාන්තාවෝ, අපි - ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් සංවත්සරයේ දී

බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලබා ගත් ශ්‍රී ලංකාවේ 70 වැනි නිදහස් සංවත්සරයේ දී, අපි - කාන්තාවෝ ලෙස සහ ශ්‍රී ලංකාව පුරා කාන්තා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන්නෝ ලෙස, 1948 වසරේ සිට ශ්‍රී ලාංකීය කාන්තා ව්‍යාපාරය විසින් නොයෙක් කම්කටොලු මැද දිනාගත්, සුවිශේෂී ජයග්‍රහණ සැමරීමට කැමැත්තෙමු. එමෙන්ම අපි මේ අවස්ථාවේ සම්පූර්ණ සමානාත්මතාවය, යුක්තිය සහ කාන්තාවන් සඳහා සංවර්ධනය යන කාරණා කුලය, පන්තිය, වාර්ගිකත්වය, ආගම, ලිංගික දිශානතිය, ස්ත්‍රීපුරුෂ සමාජභාව අනන්‍යතාවය, ආබාධිතභාවය, භූගෝලීය ප්‍රදේශය, ආදිය මත පදනම් නොවන අඛණ්ඩ අභියෝග සහ බාධක බවට පත්ව ඇති බවද සිහිපත් කරමු. අපට කාන්තාවන් ලෙස සහ ව්‍යවස්ථා සංස්කරණ, සංහිඳියාව, ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ පාලනය සහ සංවර්ධනයට ආදියට අදාළව 'නිදහස' යනුවෙන් අදහස් වන්නේ කුමක්ද යන්න සම්බන්ධවත් අපි මෙහිදී සාකච්ඡා කරමු.

**කම්කටොළු මැද දිනා ගත් වැදගත් ජයග්‍රහණ සිහිපත් කිරීම**

පරම්පරා ගණනක පුරා ශ්‍රී ලාංකීය පුරවැසියන්ට ප්‍රයෝජනවත් වූ නිදහස් සෞඛ්‍ය සේවා සහ නිදහස් අධ්‍යාපනය සහතික කරනු ලැබූ ශ්‍රී ලාංකීය පශ්චාත්-නිදහස් සුබසාධන රාජ්‍යයේ සම-ගෘහ නිර්මාණ ශිල්පීන් වන්නේ කාන්තාවන්ය. මේ ප්‍රතිපත්ති විසින් පිරිමින් ද ඇතුළුව කාන්තාවන් සඳහා හිතකර භෞතික ජීවන තත්වයක් ආරක්ෂා කර දෙන ලදී (එහෙත් සියලුම ප්‍රජාවන් සමානව මෙයින් ප්‍රයෝජන ලබා නැත). පසුගිය 70 වසරක් තුළ ලබා ගත් අනෙකුත් ප්‍රතිලාභ තුළ අඩංගු වන්නේ ජාතික ස්ත්‍රී පුරුෂසමාජභාව යන්ත්‍රණයක් ඇති කිරීම, ස්ත්‍රී දූෂණය, ලිංගික හිරිහැර සහ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ඇතුළු කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ආමන්ත්‍රණය කිරීම සඳහා අලුත් හෝ ශක්තිමත් නීති ඇති කිරීම, සහ පළාත් පාලන ඡන්දයේදී කාන්තාවන්ට 25%ක කොටසක් ලබා ගැනීම ආදියයි. කාන්තාවෝ අරගලවලදී, ඒවා සංවිධානය කිරීමේදී, ඒ සම්බන්ධයෙන් එකමුතු වී වැඩ කිරීමේ දී නිර්භීතව නායකත්වය ගෙන කටයුතු කර ඇතත්, ඒ නිසාම නොයෙකුත් කරදරවලට පාත්‍රවී ඇතත්, වෙනත් බොහෝ අවකාශයන්හි එනම් කම්කරු අයිතිවාසිකම්, ඉඩම් අයිතිවාසිකම්, දේශපාලන අයිතිවාසිකම්, සමාජ ආරක්ෂණය, ප්‍රජනන සෞඛ්‍යය සහ අයිතිවාසිකම්, යුක්තිය, විනිවිදභාවය, සහ වගවීම ආදිය සඳහා, කාන්තා අරගල විසින් ලබා ගෙන ඇත්තේ සීමාසහිත සාර්ථකත්වයකි. එසේ වුවද එකට වැඩ කිරීමේ, සාමූහිකව අරගල කිරීමේ ධෛර්යයසම්පන්න උදාහරණ සිවිල් යුද්ධය අතරතුර කාන්තාවන් විසින් නොමඳව සපයා ඇත.

**තවමත් කෙරෙන අඛණ්ඩ අරගල**

යුද්ධයෙන් වසර 9කට කිට්ටු කාලයක් ගතව ඇතත්, කාන්තාවෝ තවමත් අඛණ්ඩ **මිලිටරිකරණයට** එරෙහිව සිය විරෝධය දක්වති; තමන්ගේ ඉඩම් නැවත ලබා ගැනීම සම්බන්ධයෙන් අරගල කරති; මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් සත්‍යය සහ යුක්තිය සොයති. බොහෝ පවුල් සඳහා, විශේෂයෙන්ම උතුරු නැගෙනහිර කාන්තාවන් ගෘහ මූලිකත්වය දරන පවුල්වල ඇති ජීවිකාවක් නැති වීම, ණයගැතිභාවයේ වැඩි වීම, යුද්ධයෙන් සිදු වූ ආර්ථික හා වෙනත් හානි සඳහා වන්දි ගෙවීම් අඩු වීම, ඇතුළු ගණන් කළ නොහැකි තරම් වන ආර්ථික අභියෝගතා ගණනාවකි. විශේෂයෙන් කාන්තාවන්ගෙන් බලාපොරොත්තු වෙන්නේ අතිශයින් අඩමාන, අස්ථිර ස්වයං-රැකියා සහ අවම ආදායම් මාර්ග හරහා ජීවිකාවක් ඉපැයීමය. එසේ වුවද, කාන්තාවෝ අඛණ්ඩව තමන්ට, තමන්ගේ පවුල්වලට, සහ ප්‍රජාවන්වලට නඩත්තු කිරීමට උදව් සපයන අතර, ඒ ගැන තීරණ ද ගනිති.

**ලිංගික සහ ශාරීරික ස්වාධිපත්‍යයේ** මූලික පැතිකඩ සම්බන්ධයෙන් කාන්තාවන් කිසිදු දෙයක් ලබා නැත. ගබ්සා කිරීම සහ සමලිංගික සම්බන්ධතා තවදුරටත් නීතිමය අපරාධ ලෙස නොසලකන ලෙස ඉල්ලමින්, අයාල ආඥා පනත ඉවත් කරන ලෙස ඉල්ලමින් (ලිංගික-ශ්‍රමිකයන්ට හිරිහැර කිරීමට සහ ඔවුන් පහත හෙළීමට භාවිතා වූ යල්පැන ගිය, යටත්විජිතවාදී නීතියකි), විවාහය තුළ සිදුවන ස්ත්‍රී දූෂණය අපරාධයක් කරන ලෙස ඉල්ලමින්, මත්පැන් මිලදී ගැනීමට, නිෂ්පාදනය කිරීමට සහ සැපයීම කිරීමට ඇති අයිතිය හඳුනා ගන්නා ලෙස පවා ඉල්ලීමට සිදු වෙමින්, කාන්තාවෝ පසුපස අඩියට වැටී සිටිති.

**ශ්‍රමය** සම්බන්ධ රාජ්‍ය කතිකාව විසින් කාන්තාවන් විසින් තමන්ගේ නිවෙස්වල සහ තමන්ගේ පවුල් වෙනුවෙන් සිදු කරන මුදල් නොගෙවන අප්‍රමාණ රැකවරණ-වැඩ ප්‍රමාණය වෙත අඩු සැලකිල්ලක් දක්වයි. රාජ්‍යයේ නවලිබරල්වාදී ප්‍රතිපත්ති කෙරේ වැඩිවෙමින් පවතින හැරවුම විෂමානුපාතික ලෙස කාන්තාවන්ට බලපා ඇත. ලංකාවේ කාන්තාවෝ සැහෙන ගණනක් පිටරට රැකියාවල, වතු, සහ ඇඟලුම් කර්මාන්තවල නියැලී සිටිති. ඔවුහු ප්‍රායෝගිකව තමන්ට කිසි ආරක්ෂාවක් නැති නමුත්, රාජ්‍යය වෙනුවෙන් සැලකියයුතු ලාභ උපයා දෙනු

ලබති. තවමත්, රාජ්‍යය විසින් තම සංවර්ධන දර්ශකයන් තුළ ශ්‍රී ලංකාවේ කාන්තාවන් විශාල ප්‍රමාණයක් 'ආර්ථිකව අකර්මණ්‍ය' බැව් ගිරවුන් සේ ප්‍රකාශ කරති. රාජ්‍යය විසින් සහතික කර ඇති කාන්තා අයිතිවාසිකම් සහ ආරක්ෂාවන්, දශක ගණනාවක් තිස්සේ ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘතිය සහ ආර්ථිකය වෙනුවෙන් කාන්තාවන්ගේ දායකත්වය හා සසඳන කල අති විශාල වශයෙන් විෂමානුපාතිකය.

තවද, රාජ්‍ය සංවර්ධන ප්‍රතිපත්ති සහ සැලසුම්, සම්පූර්ණ ප්‍රජාවන්ගේ මහා පරිමාණ අවතැන්වීම්වලට හේතු වී ඇත. රජයේ ප්‍රමුඛතාවයන් අසාධාරණ ලෙස දැනටමත් වරප්‍රසාද ලත් අයටම වැඩි උපකාරයක් සැලසෙන සේ, අඩු-ආදායම් ප්‍රජාවන්ගේ, සියලු ආකාරයේ සුළුතරයන්ගේ, ඉතිහාසය පුරා කොන් වූ ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් නොසලකා හරිමින් සැකසී ඇත.

**කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහි හිංසනය** සහ ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාව සුළුතරයන්ට එරෙහි හිංසනය දණ්ඩ මුක්තියක් සහිතව අපගේ පවුල්වල, අපගේ ප්‍රජාවන්වල සහ රාජ්‍ය ව්‍යුහයන්හි හස්තයන් හරහා අඛණ්ඩව ක්‍රියාත්මක වෙයි. ඩිජිටල් අන්තර්ජාලීය අවකාශයන්හි පිළියම් සැපයීමේ කිසිදු ක්‍රමවේදයක් නැතුව කාන්තාවෝ වැඩි වැඩියෙන් ප්‍රචණ්ඩත්වය අත් විඳිති. පළාත් පාලන ඡන්ද ව්‍යාපාරයේ දී, කාන්තා ඡන්ද අපේක්ෂකයන් කෙරේ යොමු වුනු ප්‍රචණ්ඩත්වය, 'ගැහැණු දේශපාලනයට ගැලපෙන්නේ නැහැ' යන්නට සීමා කිරීම, දේශපාලනයේ කාන්තා ප්‍රතිරූප වැඩි වැඩියෙන් මතුවීමත් සහ වෙනස් කොට සැලකීම සහ පීඩනයට එරෙහිව කාන්තා විරෝධතාවයන්හි වැඩිවෙන හඬටත් එරෙහිව කෙරෙන පෙරලා පහර දීමක දරදඬු මතක් කිරීමකි. විශේෂයෙන්ම **පළාත් සහ පාර්ලිමේන්තු මට්ටම්වල දී කාන්තා දේශපාලනික නියෝජනය වැඩි කිරීම** ගැන බරපතල බාධක ඇත. වෙනස් කොට සලකන **මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත** (MMDA) සංශෝධනය කිරීම සම්බන්ධයෙන් ඇති ආපස්සට ඇදීම විසින් හෙළි කරන්නේ දේශපාලනික, ආගමික සහ ප්‍රජා නායකත්වය හරහා සිදු වෙන ලිංගික ආන්තිකවාදය සහ කාන්තාවන්ට එරෙහි ඇති වෛරී විරෝධයයි.

වැඩි වෙමින් පවතින **වාර්ගික- ආගමික ප්‍රචණ්ඩත්වය සහ අන්තවාදය** කාන්තාවන්ට එකසේ බලපාන අතර; සමස්තයක් ලෙස, රාජ්‍ය සහ සමාජීය මට්ටමේ මතවාදීමය පිරිහීමක් ඇත. කරදර සහගත, පීතෘ මූලික, විෂමලිංග සම්මතවාදී දැක්මක් විසින් කාන්තාවන් යල්පැන ගිය ස්ත්‍රී පුරුෂ සමාජභාව භූමිකාවන් සහ ඒකාකෘතීන් වෙතට ආපසු තල්ලු කරයි. 'කාන්තාව' යනු 'මවක්' ලෙස, 'පවුල' තබා ගන්නා කෙනෙකු ලෙස, සහ ඇගේ ප්‍රජාවේ සහ ජාතියේ ගෞරවය ගෙන යන්නා ලෙස ඇති අදහස් හා මෙය ගැඹුරින් බැඳී ඇත. 'සංස්කෘතිය'ට අදාළ කාරණාවන් සැම තිස්සේම පිරිමින්ට ලේසි වෙන ලෙසත්, ගැලවීමක් වෙන ලෙසත්, කාන්තාවන්ගේ නිදහස සහ අයිතීන් සීමා කරන ලෙසත් භාවිතා වේ.

**ඉදිරියට යාම**

'නිදහස්' රාජ්‍යය යැයි හඳුන්වන තැන තුළ, කාන්තාවන්ගේ ස්වාධිපත්‍යය සමාජමය වශයෙන්, සංස්කෘතික වශයෙන්, ව්‍යුහාත්මකව සීමා කර ඇති විට, ඇතැම් සම්ප්‍රදායික නීති හරහා කාන්තාවන් යනු තීරණ ගැනීමට නොගැලපෙන අඩු වයස් අය ලෙස රාජ්‍යයේ ඇස් හරහා දකින විට, අපට කාන්තාවන් ලෙස 'නිදහස' යනුවෙන් අදහස් වෙන්නේ කුමක්ද?

නිදහස යනුවෙන් අපට අදහස් වෙන්නේ විනිවිදභාවය සහ වගවීම රාජ්‍ය ප්‍රැක්සිසය තුළ; අදහස් විමසීම සහ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාම තුළ සහභාගීත්වය වෙන අතර, මෙයට ව්‍යවස්ථා සංශෝධනය, සංක්‍රාන්ති යුක්ති ක්‍රියාදාමයන් අයිති වේ. එයින් අදහස් වෙන්නේ ස්වායත්තව, එකිනෙකා හා සමානව මේ සියලු ක්‍රියාදාමයන්හි යෙදීමට අපට ඇති අයිතිය සහතික කිරීමයි. නිදහස යනු අපේ මිත්තණියන් විසින් සටන් කරන ලද සමාජ සුබසාධන ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම, සහ ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් යනු මූලික අයිතිවාසිකම් ලෙස පිළි ගැනීමයි. එයින් අදහස් වෙන්නේ නිදහස් කාන්තා කොමිසමක් පිහිටුවීම, ව්‍යවස්ථාවේ 16 වැනි වගන්තිය ඉවත් කිරීම (වෙනස් කොට සැලකීමේ නීතී අධිකරණ පරීක්ෂණයකට ලක් වීමෙන් වලකා ලමින් ඒවායේ පැවත්මට උදව්කරන නීතියකි ),සහ ව්‍යවස්ථාවෙන් පිළි ගනු ලබන ලිංගික සහ ශාරීරික ස්වාධිපත්‍යය ඇතුළු කාන්තා ආරක්ෂාවන් ලබා දීම ය.

රාජ්‍යය විසින් වැඩි වැඩියෙන් නවලිබරල්වාදී අ ාර්ථික ක්‍රමයක, සහ නවලිබරල්වාදී ප්‍රතිපත්තියක් තුළ, මතවාදීමය සහ ප්‍රායෝගික වශයෙන් යන දෙවිදියෙන්ම, ආයෝජනය කරන මොහොතක - මානව හිමිකම් යනු හරියක් ලකුණක් කරන කොටුවක් පමණක් වී ඇති තැනක - නිදහස යනුවෙන් අදහස් වන්නේ ශ්‍රී ලාංකිකයන්ගේ විවිධ ජීවන යථාර්ථයන් තේරුම් ගනිමින් මානව හිමිකම් අර්ථ සම්පන්න ලෙස ක්‍රියාත්මක කිරීම යි.

අවසාන වශයෙන්, අපි කෘතඥතාවය ප්‍රකාශ කරමින්, සමරන්නේ යුද කාලයේ මෙන්ම, සාම කාලයේද, එකතුව මායිම්, සීමාවන්වලින් එතෙරට යමින්, සාමය, යුක්තිය, සමානාත්මතාවය වෙනුවෙන් කටයුතු කළ ශ්‍රී ලාංකීය කාන්තාවන් විශාල ප්‍රමාණයයි. අපි මේ අරගලය දිගටම කර ගෙන යන්නට කැප වෙන අතර, ලෝකය පුරා සිදු වෙන අඛණ්ඩ කාන්තා අරගලවලින් අනුප්‍රාණය ලබා ගන්නෙමු. මෙය දේශීය සහ ගෝලීය වශයෙන් වැදගත් සහ සිත්ගන්නා සුළු මොහොතක් ලෙස අප දකින අතර, කාන්තාවන් විසින් සමාජයේ තදබල ලෙස ගිලා බැසුණු කාන්තාවන්ට එරෙහි වෛරී විරෝධය අභියෝගයට ලක් කරමින්, පීතෘමූලිකත්වයට ප්‍රතිවිරෝධතා දක්වමින්, නිශ්ශබ්දතාවය බිඳ දමමින්, බලය කඩාබිඳ දමමින්, සහ රජයයන් නිසා නොව, රජයයන් තිබියදී පවා පීඩනයට සහ කොන්කිරීමට ලක් වෙමින්, අඛණ්ඩව තමන්ගේ අරගලවල වැදගත් සන්ධිස්ථාන වෙත ළඟා වෙති.

## තනි පුද්ගල අත්සන්:

මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ
ආචාර්ය කුමාරි ජයවර්ධන
ආචාර්ය හරිනි අමරසූරිය
ශ්‍රීන් අබ්දුල් සරූර්
කුමුදුනී සැමුවෙල්
ආචාර්ය සේපාලි
කෝට්ටේගොඩ
අන්බේරියා හනීෆා්
සුභා විජේසිරිවර්ධන
එර්මිසා ටෙගාල්
චූලනි කොඩිකාර
ටෙහානි ආරියරත්න
ශාෆිනාස් හසේන්දීන්
ඩියැන් උයන්ගොඩ
සුමිකා පෙරේරා
හසානාහ් චේගු ඉසදීන්
පබා දේශප්‍රිය
ශිරානී මිල්ස්
සාරා සොයිසා
ආචාර්ය ආශා එල්.
අබේසේකර
අනූපමා රණවන
මරීසා ද සිල්වා
සරලා එම්මැනුවෙල්
සයිනාබ් ඉබ්‍රාහිම්
ශාරනායා සේකරම්
ආචාර්ය ශර්මාල් විජේවර්ධන
වයලා පෙරේරා
කිමායා ද සිල්වා
වේලායුදන් ජයචිත්‍රා
සාංචියා බ්‍රවුන්
තරංග පෙරේරා

## සංවිධාන:

කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය, කොළඹ

කාන්තා අධ්‍යාපන සහ පර්යේෂණ මධ්‍යස්ථානය (WERC), කොළඹ

සූරියා කාන්තා සංවර්ධන මධ්‍යස්ථානය, මඩකලපුව

කාන්තා සම්පත් මධ්‍යස්ථානය, කුරුණෑගල